# 4

# මිල, වැටුප්, සේවා නියුක්තිය සහ ඵලදායිතාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) සහ කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, වසරේ මේ දක්වා කාලය තුළ මිශ්‍ර විචලන පෙන්නුම් කරන ලදී. ප්‍රධාන වශයෙන්ම ආහාර කාණ්ඩයේ මිල විචලනවලට අනුරූප වූ පොදු මිල මට්ටමෙහි විචලන සඳහා ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල විචලන ද තරමක් දුරට දායක විය. සැපයුම් අංශයේ දක්නට ලද හිතකර ප්‍රවණතා හේතුවෙන්, මැයි සහ ජූනි මාසයන් හැර 2018 වසරේ පළමු මාස නවය තුළ දී සමස්ත ආහාර මිල පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. තවද, වසරේ පළමු මාස නවය තුළ ආහාර නොවන කාණ්ඩයෙහි මිල ඉහළ යෑම සඳහා ඉන්ධන, ගෑස් සහ බස් ගාස්තුවල පරිපාලිත මිල ඉහළ දැමීම ප්‍රධාන හේතුවක් විය. ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2018 වසරේ පළමු මාස නවය තුළ දී වැඩි වශයෙන් මැද තනි අගයට වඩා අඩු අගයක පැවතුණි. ජා.පා.මි. දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන යටිදැරි උද්ධමනය මෙම කාලපරිච්ඡේදය තුළ අඩු උච්චාවචනයක් පෙන්නුම් කළේය. උද්ධමන අපේක්ෂා ගත්කල විශේෂයෙන්ම ව්‍යාපාරික අංශයෙහි උද්ධමන අපේක්ෂා සැබෑ උද්ධමනයට බොහෝ සෙයින් අනුරූප විය. වැටුප් පිළිබඳව සලකා බැලීමේදී විධිමත් අංශයෙහි මූර්ත වැටුප්වල පහළ යෑමක් දක්නට ලැබුණු අතර අවිධිමත් අංශයෙහි මූර්ත වැටුප්වල ඉහළ යෑමක් වාර්තා විය. සේවා නියුක්ති අංශය ගත්කල, 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ ගිය අතර සේවා වියුක්ති අනුපාතිකය ඉහළ ගියේය. ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය පහළ යෑමට, ශ්‍රම බලකායේ පහළ යෑම මෙන්ම වැඩ කරන වයසේ ජනගහනයේ ඉහළ යෑම ද හේතු විය. ව්‍යවසායකත්වය හා ව්‍යාපාර ආරම්භ කිරීම ප්‍රවර්ධනය කිරීමෙහි ලා රජය විසින් ක්‍රියාත්මක කරමින් පවතින විවිධ වැඩසටහන් හේතුවෙන් ඉදිරි කාලයේ දී නිර්මාණය වන රැකියා අවස්ථා ප්‍රමාණය ඉහළ යා හැකිය. කෙසේ වෙතත්, ආර්ථිකයේ නැගී එන බොහෝ අංශ තුළ ශ්‍රම හිඟයන් නිර්මාණය කරමින්, නිපුණතාවල නොගැළපීම් සහ ස්ත්‍රී-පුරුෂ විෂමතා වැනි ව්‍යුහාත්මක අඩුලුහුඩුකම් ශ්‍රම වෙළඳපොළ තුළ තවදුරටත් පවතී. විදේශ රැකියා සඳහා පිටත්ව යන සංඛ්‍යාව මගින් පිළිබිඹු වන පරිදි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා ඇති විදේශ රැකියා අවස්ථා අඩු වී ඇති අතර ඒ සඳහා ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයන්ගේ ප්‍රධාන ගමනාන්තවල උද්ගත වී ඇති අයහපත් භූ-දේශපාලනික ප්‍රවණතා හේතු වී ඇත. මේ අතර, රටේ ආර්ථික ක්‍රියාකාරකම් සහ පොදු ජනතාවගේ සමාජ ජීවිතයට බාධා ඇති කරමින් රාජ්‍ය අංශය තුළ වැඩ වර්ජන ගණනාවක් ක්‍රියාත්මක වූ අතර කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත අනුව පෞද්ගලික අංශයේ වැඩ වර්ජන සංඛ්‍යාවේ අඩු වීමක් දක්නට ලැබුණි.

4

## 2018 වසරේ ප්‍රවණතා

### මිල

#### පොදු මිල මට්ටමේ විචලන

- **ජා.පා.මි.ද. මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2018 වසරේ පළමු මාස තුන තුළ දී පහළ යන නැඹුරුවක් පෙන්නුම් කළ අතර ඉන් අනතුරුව ජූලි මාසය තෙක් ඉහළ ගොස් ඉන්පසු පහළ ගියේය.** කො.පා.මි.ද. මගින් මනිනු ලබන පොදු මිල මට්ටම ද ඒ හා සමාන ප්‍රවණතාවයක් සලකනු ලබන කාලපරිච්ඡේදය තුළ දී පෙන්නුම් කළේය. මෙම කාල සීමාව තුළ දී, පොදු මිල මට්ටම ප්‍රධාන වශයෙන් ආහාර කාණ්ඩයේ අයිතමවල මිල විචලනයන්හි හැසිරීම අනුගමනය කළේය. ඉහළ යන නැඹුරුවකින් විචලනය වූ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ද, පොදු මිල මට්ටමේ විචලනය සඳහා දායක විය.

- **නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල[1] මිල විචලනයට බොහෝ සෙයින් අනුරූප වූ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල, වසරේ පළමු මාස හතර තුළ දී පහළ යන නැඹුරුවක් පෙන්නුම් කළ අතර, ඉන් අනතුරුව ජුනි මාසය දක්වා ඉහළ ගොස්, නැවතත් පහළ ගියේය.** 2018 වසරේ පළමු මාස හතර තුළ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල, පහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. මේ සඳහා, සහල්, එළවළු සහ ඇඹුල්වල මිලෙහි පහළ යෑම ද, විටින් විට පහළ ගිය පොල්, නැවුම් මත්ස්‍ය සහ අර්තාපල් යන අයිතමයන්හි මිල විචලන ද දායක විය. ඉන් අනතුරුව, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවලින් නැවුම් මත්ස්‍ය, එළවළු, අර්තාපල් සහ ළූණු යන අයිතමවල මිල, සෘතුමය බලපෑම් හේතු කොට ගෙන 2018 මැයි සහ ජුනි මාස තුළ දී ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 ජූලි මාසය තුළ දී, සහල් සහ පොල් වැනි අයිතමවල මිලෙහි සැලකිය යුතු පහළ යෑමක් දක්නට ලැබුණි. 2018 අගෝස්තු සහ සැප්තැම්බර් මාස තුළ දී සහල්, පොල්, නැවුම් මත්ස්‍ය සහ එළවළු මිල නැවතත් පහළ යෑම හේතුවෙන්, නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතමවල මිල මට්ටම තව දුරටත් පහළ ගියේය. 2017/18 මහ කන්නයේ අස්වැන්න යථා තත්ත්වයට පත්වීම සහ සහල් ආනයනය කිරීම හේතු කොට ගෙන, බොහෝ සහල් වර්ගවල මිල ගණන්, 2018 පළමු මාස නවය තුළ දී, මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වසර ආරම්භයේ දී පහළ මට්ටමක පැවති නැවුම් මත්ස්‍ය මිල, සෘතුමය බලපෑම් නිසා පහළ වැටුණු නිෂ්පාදනය හේතු කොට ගෙන වසරේ දෙවන කාර්තුව තුළ දී ශීඝ්‍ර ලෙස ඉහළ යෑමට පටන් ගත්තේය. කෙසේ වුවද, වසරේ තුන්වන කාර්තුව තුළ දී, මත්ස්‍ය මිල මට්ටම තරමක් දුරට පහළ ගියේය. දීර්ඝ කාලීනව පැවති නියං තත්ත්වය හේතුවෙන් පහළ වැටුණු පොල් නිෂ්පාදනයෙහි ප්‍රතිඵලයක් ලෙස ඉහළ යමින් පැවති පොල් මිල පාලනය කිරීම සඳහා රජය විසින් 2017 දෙසැම්බර් මාසයේ සිට පොල් මද ආනයනය කිරීම සඳහා අවසර ලබාදෙන ලදී. එමෙන්ම 2017 වසර තුළ දී විශාල ලෙස අඩු වූ පොල් නිෂ්පාදනය 2018 දෙවන කාර්තුව තුළ දී යථා තත්ත්වයට පත්විය. ඒ අනුව, 2018 ජනවාරි මාසයේ දී පොල් මිලෙහි පහළ යෑමක් පෙන්නුම් කළ අතර, 2018 මාර්තු මාසය වන තෙක් එම මිල මට්ටමේ රැඳී තිබී, ඉන් අනතුරුව තව දුරටත් පහළ ගියේය. එළවළු මිල 2018 අප්‍රේල් මාසය වන තෙක් පහළ ගිය අතර, ඉන් අනතුරුව ඉහළ ගොස්, 2018 අගෝස්තු මාසයේ දී නැවතත් පහළ ගොස් 2018 සැප්තැම්බර් මාසයේ දී තවදුරටත් පහළ ගියේය. මේ අතර, සලකනු ලබන කාලපරිච්ඡේදය තුළ දී අර්තාපල් සහ ලොකු ළූණු ද මෙයට සමාන මිල විචලනයක් අනුගමනය කළ අතර, වසර ආරම්භයේ දී පහළ වැටුණු රතු ළූණු මිල ඉන් අනතුරුව එම මට්ටමේම පැවතුණු අතර, ඉන් පසුව 2018 අගෝස්තු සහ සැප්තැම්බර් මාස වලදී පහළ ගියේය.

- **නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැරුණු කොට, ආහාර කාණ්ඩයේ ඇති අනෙකුත් අයිතමවල මිල වසරේ පළමු මාස දෙක තුළ පහළ ගොස්, ඉන් අනතුරුව සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය.** මෙම අයිතම අතුරින්, පරිප්පු සහ සීනි මිල ජාත්‍යන්තර වෙළඳපොළෙහි මිල විචලනවලට අනුරූප විය. වසර ආරම්භයේ දී පහළ ගිය පරිප්පු මිල නැවතත් 2018 අගෝස්තු මාසයේ දී වාර්තා කළ සුළු අඩුවීම දක්වා ස්ථාවර මට්ටමක පැවති අතර, 2018 සැප්තැම්බර් මාසයේ නිරීක්ෂණය කෙරුණු සුළු ඉහළ යෑම හැරුණු කොට සලකනු ලබන කාලපරිච්ඡේදය තුළ දී සීනි මිල පහළ යන නැඹුරුවක් පෙන්නුම් කරන ලදී. කිරි පිටි මිල 2018 මැයි මාසයේ 05 වන දින සිට බල පැවැත්වෙන පරිදි ඉහළ දමන ලදී. 2018 අප්‍රේල් මාසයේ සිට ජූලි මාසය

1 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු සහ තෝරා ගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

දක්වා වන කාලපරිච්ඡේදය තුළ දී, කිරි පිටි, කරවල සහ බිත්තරවල මිලෙහි සිදු වූ වැඩි වීම, ආහාර අයිතම කාණ්ඩයේ මිල මට්ටමට, ඉහළ පීඩනයක් ඇති කළේය. පාන් පිටි සහ පාන්වල මිල පිළිවෙළින් සැප්තැම්බර් 01 සහ සැප්තැම්බර් 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි රු. 5 කින් ඉහළ දමන ලද අතර 2018 සැප්තැම්බර් 19 වන දින සිට බලපැවැත්වෙන ලෙස කිරි පිටි මිල පහළ දමන ලදී.

- **ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2018 වසරේ පළමු මාස නවය තුළ ඉහළ යන නැඹුරුවකින් යුතුව විචලනය විය.** ඉන්ධන, ගෑස්, බස් සහ දුම්රිය ගාස්තුවල සිදුකළ පරිපාලිත මිල සංශෝධන මෙම ඉහළ යෑමට දායක විය. එල්.පී. ගෑස් මිලෙහි සිදු වූ ඉහළ යෑමත් සමගම ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයෙහි ඇතැම් පිළියෙල කරන ලද ආහාර මිල ඉහළ යෑමක් දක්නට ලැබුණි. එමෙන්ම, ඉන්ධන මිලෙහි සිදු වූ ඉහළ යෑමත් සමගම, බස්, දුම්රිය, කුලී රථ/ත්‍රීරෝද රථ සහ පාසල් වෑන් ගාස්තුවල ඉහළ යෑමක් නිරීක්ෂණය කෙරිණි. එමෙන්ම, 2018 ජූලි මාසයේ 02 වන දින සිට බල පැවැත්වෙන පරිදි, රෝහල් කාමර ගාස්තු හැර අනෙකුත් සෞඛ්‍යය සේවා ගාස්තු, එකතු කළ අගය මත වන බද්දෙන් නිදහස් කරන ලදී.


## පාරිභෝගික මිල දර්ශක සහ මතුපිට උද්ධමනය

### ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.)

- **පාරිභෝගික අයිතම පැසෙහි මිල විචලන ජාතික මට්ටමින් පිළිබිඹු කරන ජා.පා.මි.ද. 2018 වසරේ පළමු මාස තුන තුළ දී පහළ යෑමේ ප්‍රවණතාවක් අනුගමනය කර, 2018 වසරේ අප්‍රේල් සිට ජූලි මාසය දක්වා ඉහළ යන ප්‍රවණතාවක් පෙන්වා එතැන් සිට පහළ ගියේය.** ඒ අනුව, 2018 වසරේ ජනවාරි මාසයේ දර්ශක අංක 125.8 ක් වූ ජා.පා.මි. දර්ශකය 2018 වසරේ මාර්තු මාසයේ දී දර්ශක අංක 122.8 දක්වා පහළ ගොස්, 2018 වසරේ ජූලි මාසයේ දී දර්ශක අංක 126.6 දක්වා ඉහළ ගොස් 2018 සැප්තැම්බර් මාසයේදී දර්ශක අංක 124.4 දක්වා පහළ ගියේය. 2018 වසරේ අප්‍රේල්, මැයි සහ ජූලි මාසවල දී ජා.පා.මි. දර්ශකයෙහි පෙන්නුම් කළ විචලන සඳහා ආහාර නොවන කාණ්ඩය විශාල දායකත්වයක් දැක්වූ අතර, අනෙකුත් මාසවල දී ආහාර කාණ්ඩය විශාල දායකත්වයක් සැපයීය.

**4.1 රූප සටහන**


**මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය ජා.පා.මි.ද. (2013=100)**




- **ජා.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස අනුව මනිනු ලබන මතුපිට උද්ධමනය, වසරේ මුල් මාස හතර තුළ දී පහළ ගොස්, 2018 ජූලි මාසය දක්වා ඉහළ යන ප්‍රවණතාවක් අනුගමනය කර පසුව පහළ ගියේය.** 2018 ජනවාරි මාසයේ දී ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සියයට 5.4 ක් වූ අතර එය අප්‍රේල් මාසයේ දී සියයට 1.6 ක් දක්වා පහළ ගොස් 2018 ජූලි මාසයේ දී සියයට 3.4 ක් දක්වා ඉහළ ගොස් නැවත 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 0.9 ක් දක්වා පහළ ගිය අතර මෙය 2016 ජනවාරි සිට වාර්තා වූ අවම අගය වේ. මේ අතර, ජා.පා.මි.ද. මගින් මනිනු ලබන වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2017 වසර තුළ දී පෙන්නුම් කළ ඉහළ යෑමේ ප්‍රවණතාවය 2018 වසරේ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවකට හැරවුනු අතර 2018 ජනවාරි මාසයේ දී සියයට 7.6 ක් ලෙස වාර්තා වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමන අගය 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 4.0 දක්වා පහළ වැටුණි.

**4.2 රූප සටහන**

**මතුපිට උද්ධමනයේ විචලන ජා.පා.මි.ද. (2013=100)**




4

## කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.)

- **කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල මිල ප්‍රවණතා පෙන්නුම් කරන කො.පා.මි. දර්ශකයෙහි විචලනය 2018 මුල් මාස නවය සඳහා ජා.පා.මි. දර්ශකයෙහි විචලනයට සමාන ප්‍රවණතා පෙන්නුම් කරන ලදී.** කො.පා.මි.ද. 2018 ජනවාරි මාසයේ දී දර්ශක අංක 122.8 ක් වූ අතර එය 2018 මාර්තු මාසයේ දී දර්ශක අංක 121.4 දක්වා පහළ ගොස් නැවතත් සැප්තැම්බර් මාසය වන විට දර්ශක අංක 124.9 ක් දක්වා ඉහළ ගියේය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී, 2018 අප්‍රේල් සහ අගෝස්තු මාස හැර කො.පා.මි. දර්ශකයෙහි විචලනයට, ආහාර කාණ්ඩයේ වූ මිල විචලන ප්‍රධාන ආයකත්වයක් දැක්වීය.

- **2018 අප්‍රේල් දක්වා පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් පෙන්නුම් කරන මතුපිට උද්ධමනය ඉන්පසුව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කර, සැප්තැම්බර් මාසයේ දී නැවත පහළ අගයක් ගන්නා ලදී.** 2018 ජනවාරි මාසයේ දී සියයට 5.8 ක් වූ මතුපිට උද්ධමනය අප්‍රේල් මාසයේ දී සියයට 3.8 දක්වා පහළ ගිය අතර නැවතත් අගෝස්තු මාසයේ දී වාර්තා වූ සියයට 5.9 දක්වා ක්‍රමයෙන් ඉහළ ගොස් සැප්තැම්බර් මාසයේ දී සියයට 4.3 දක්වා පහළ ගියේය. මේ අතර, 2018 ජනවාරි මාසයේ දී සියයට 6.6 ක් ලෙස වාර්තා වූ කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 5.4 දක්වා පහළ ගියේය.

## මූලික උද්ධමනය

- **ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය සලකා බලන කාලපරිච්ඡේදයේ දී ස්ථාවර මට්ටමක පැවතුණි.** ඒ අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2018 පළමු මාස පහ තුළ දී පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද අතර, එය ජනවාරි මාසයේ පැවති සියයට 2.1 සිට 2018 මැයි මාසය වනවිට සියයට 1.7 ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, මෙම ප්‍රවණතාව වෙනස් කරමින් ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 3.1 ක් දක්වා නැවතත් ඉහළ යන ලදී. මේ අතර, සළකාබලන කාලපරිච්ඡේදය තුළ දී කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය මිශ්‍ර විචලන පෙන්නුම් කළ අතර, 2018 ජනවාරි මාසයේ දී සියයට 3.5 ලෙසත් 2018 සැප්තැම්බර් මාසයේ දී සියයට 3.8 ලෙසත් වාර්තා විය.

## නිෂ්පාදකයාගේ මිල දර්ශකය

- **ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින්, දේශීය නිෂ්පාදකයාට භාණ්ඩ හා සේවා සඳහා ලැබෙන මිලෙහි වෙනස්වීම මගින් ගණනය කරනු ලබන නිෂ්පාදකයාගේ මිල දර්ශකය (නි.මි.ද., 2013 සිව්වන කාර්තුව=100), 2018 පළමු මාස අටේ දී මිශ්‍ර විචලනයක් පෙන්නුම් කරන ලදී.** කෘෂිකාර්මික, නිෂ්පාදන කර්මාන්ත සහ විදුලිය හා ජල සැපයුම් යන මෙම දර්ශකයට අයත් උප අංශ සියල්ලේම නිෂ්පාදක මිල, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී මිශ්‍ර විචලන දක්වමින් ඉහළ ගියේය. මේ අතර, 2018 මාර්තු සහ ජූලි මාස හැර 2018 පළමු මාස අටේ දී නි.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන නිෂ්පාදක මිල උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලද අතර එය කෘෂිකර්මාන්ත උප අංශයේ නිෂ්පාදක මිලෙහි පෙන්නුම් කළ උද්ධමන ප්‍රවණතාවට බොහෝ දුරට අනුකූල විය.

## මිල ගණන් මත රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවල බලපෑම


- **සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති කිහිපයක සෘජු බලපෑම පොදු මිල මට්ටම මත දක්නට ලැබුණි.** ශීඝ්‍ර ලෙස ඉහළ ගිය දේශීය මිල ගණන් පාලනය කිරීමට සහල් සහ පොල් මද ආනයනය කිරීමට රජය ගත් තීරණය මිල පාලනයට ඉතා හිතකර විය. එමෙන්ම අර්තාපල් හා ලොකු ළූණු වැනි සමහර ආනයනික භාණ්ඩ මත පනවා තිබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අස්වනු නොමැති කාලයේ දී වැඩි කිරීම හේතුවෙන්, එම භාණ්ඩවල මිල ගණන් තවදුරටත් වැඩිවිය. 2018 මැයි 11 වන දින සිට බලපැවැත්වෙන ලෙස නිෂ්පාදන පිරිවැය පිළිබිඹු වන ඉන්ධන මිල සූත්‍රයක් හඳුන්වා දුන් අතර, උද්ධමන බලපෑම අඩු වශයෙන් බලපවත්නා කාලයේ දී මෙම මිල සූත්‍රය හඳුන්වාදීම වඩාත් කාලෝචිත තීරණයක් විය.



4

**4.3 රූප සටහන**

**ව්‍යාපාරික අංශයේ උද්ධමන අපේක්ෂා**




## උද්ධමන අපේක්ෂා

- **2018 ජනවාරි මාසයේ සිට පහළ යන ප්‍රවණතාවක් පෙන්නුම් කළ ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂා, 2018 ජූලි මාසයේ දී ඉහළ ගියේය.** මෙම වසරේ මුල් මාස නවය තුළ උද්ධමන අපේක්ෂා පෙන්නුම් කළ ප්‍රවණතාව, නිල මිල දර්ශක මගින් පෙන්නුම් කළ උද්ධමන ප්‍රවණතා සමග මනාව ගැලපුණි. මෑත කාලයේ ඉන්ධන මිලෙහි සිදු වූ වැඩිවීම හා දේශීය ව්‍යවහාර මුදලේ විදේශීය අගය අවප්‍රමාණය වීම යන හේතු නිසා ව්‍යාපාර අංශයේ උද්ධමන අපේක්ෂාවල ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. ව්‍යාපාර අංශයේ අපේක්ෂාවලට වඩා ස්වභාවයෙන්ම ඉහළ මට්ටමක පවතින කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂා 2018 මැයි සිට අගෝස්තු දක්වා අඛණ්ඩව පහළ ගිය අතර, නැවතත් 2018 සැප්තැම්බර් මාසයේ දී ඉහළ ගියේය. දේශීය සැපයුම් අංශයේ සිදු වූ අඩාලවීම් සහ ඉන්ධන මිල වැඩිවීම යන හේතු කුටුම්භ අංශයේ උද්ධමන අපේක්ෂාවල වැඩිවීමට බලපාන ප්‍රධාන හේතු ලෙස දක්වා තිබුණි.

## වැටුප්


- **අන්තර් අතුරු දීමනාව මූලික වැටුපට කොටස් වශයෙන් අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන්, රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 පළමු මාස අට තුළ දී සියයට 0.1 කින් සුළු වශයෙන් වර්ධනය විය.** කෙසේ වුවද, එම කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප්වල සියයට 2.7 ක අඩුවීමක් දක්නට ලැබුණි. මේ අතර, 2018 අගෝස්තු මස 20 දින රාජ්‍ය අංශයෙහි වැටුප් විෂමතා විසඳීම සඳහා සාමාජිකයන් 15 දෙනෙකුගෙන් සමන්විත විශේෂ වැටුප් කොමිසමක් පත් කරන ලදී.

- **පඩි පාලක සභා විසින් වැටුප් පාලනය කරනු ලබන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2018 පළමු මාස අට තුළ දී සියයට 0.1 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.** මුද්‍රණ, රෙදිපිළි නිෂ්පාදන, ටයර් සහ ටියුබ් නිෂ්පාදනය සහ ඇඟලුම් නිෂ්පාදනය යන කර්මාන්තවල, 2018 අගෝස්තු මාසයේ සිදු වූ අවම වැටුප් වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙම කාලපරිච්ඡේදය තුළ දී නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි ප්‍රතිශතක වර්ධනය ඉතා අවම මට්ටමක පැවතීම හේතුවෙන්, විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් සියයට 4.4 කින් පහළ ගියේය.

- **අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2018 පළමු මාස අට තුළ දී සියයට 13.3 ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** අවිධිමත් පෞද්ගලික අංශයෙහි වැටුප් බොහෝ විට ශ්‍රම ඉල්ලුම් සහ සැපයුම් තත්ත්ව මත පදනම් වීම මේ සඳහා හේතු විය. මේ අතර, 2018 පළමු මාස අට තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ද සියයට 10.0 කින් ඉහළ ගියේය. සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පෙදරේරු සහ වඩු කාර්මික වෘත්තීන්හි ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් එම වෘත්තීන්හි වැටුප්වල ඉහළ යෑමක් දක්නට ලැබුණි.

**4.4 රූප සටහන**

**මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස්වීම**




4

## ශ්‍රම බලකාය හා සේවා නියුක්තිය


- ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කර ඇති දත්ත අනුව, 2018 වසරේ පළමු භාගය තුළ වැඩ කරන වයසේ ජනගහනය[2] ඉහළ ගිය ද, ශ්‍රම වෙළඳපොළ තුළ අඛණ්ඩව පවතින ව්‍යුහාත්මක ගැටලු හේතුවෙන් ශ්‍රම බලකාය වෙත වැඩ කරන වයසේ ජනගහනයේ ඵලදායී දායකත්වය විභව මට්ටමට වඩා පහළින් පැවතුණි. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 51.5 දක්වා අඩු වී ඇති අතර 2017 වසර තුළ දී යහපත් ප්‍රවණතාවක් පෙන්වූ ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 33.0 දක්වා පහළ වැටුණි. මේ අතර, සමස්ත සේවා වියුක්තිය සියයට 4.5 ක් දක්වා වර්ධනය විය. ශ්‍රමිකයන් සඳහා කැපී පෙනෙන ඉහළ ඉල්ලුමක් පැවතිය ද, තරුණයින්, ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති පුද්ගලයින් හා කාන්තාවන් අතර සේවා වියුක්තිය, ප්‍රගතියක සළකුණ නොපෙන්වමින් දිගින් දිගටම ඉහළ මට්ටමක පැවතුණි. ශීඝ්‍රයෙන් වෙනස් වන රැකියා වෙළඳපොළෙහි අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය වෙනස් නොවීමේ ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රමය සඳහා වන ඉල්ලුම හා ශ්‍රම සැපයුම අතර පරතරයක් පවතින බව සේවායෝජකයෝ දිගින් දිගටම අවධාරණය කරන ලදී. මෑත කාලීනව දක්නට ලැබුණු ශ්‍රම බලකාය හා සම්බන්ධ දර්ශකවල එකිනෙකට නොගැළපෙන විචලනවලට හේතු ලෙස මෑත කාලයේ දී ඇති වූ අහිතකර කාලගුණික තත්ත්ව හේතුවෙන් බලපෑමට ලක් වූ පුළුල් අවිධිමත් අංශය සහ රැකියා කෙටිකාලීන වීම, ඉහළ ශ්‍රම පිරිවැටුම සහ ස්වේච්ඡා රැකියා වියුක්තිය වැනි ශ්‍රම වෙළඳපොළෙහි නූතන ප්‍රවණතා හැඳින්විය හැකිය.

2 වයස අවුරුදු 15 සහ ඊට වැඩි ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය (ශ්‍රම බලකාය) සහ ආර්ථික වශයන් අක්‍රීය ජනගහනය යන දෙපිරිසෙන්ම වැඩ කරන වයසේ ජනහනය සමන්විත වේ.

4

**4.5 රූප සටහන**

**ශ්‍රම වෙළඳපොළ තොරතුරු - 2018 වසරේ පළමු භාගය (අ)**




(අ) තාවකාලික

*මූලය:* ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**4.1 සංඛ්‍යා සටහන**
**ශ්‍රම බලකාය, සේවා නියුක්තිය සහ සේවා වියුක්තිය (අ)**

| අයිතමය | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| | පළමු භාගය | වාර්ෂික | පළමු භාගය | පුරෝකථන (වාර්ෂික) |
| කුටුම්භ ජනගහනය, '000 (වයස අවුරුදු 15 සහ ඉහළ) | 15,749 | 15,844 | 16,191 | 16,088 |
| ශ්‍රම බලකාය, '000 | 8,551 | 8,567 | 8,343 | 8,736 |
| සේවා නියුක්ත, '000 | 8,184 | 8,208 | 7,966 | 8,343 |
| සේවා වියුක්ත, '000 | 367 | 359 | 377 | 393 |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (කුටුම්භ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස) | 54.3 | 54.1 | 51.5 | 54.3 |
| සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | 4.3 | 4.2 | 4.5 | 4.5 |

(අ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## ශ්‍රම බලකාය

- **2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළ දී, වැඩ කරන වයසේ කුටුම්භ ජනගහනය සියයට 2.8 කින් ඉහළ ගිය අතර ශ්‍රම බලකාය මිලියන 8.551 සිට 8.343 දක්වා සියයට 2.4 කින් පහළ ගියේය.** වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත හෝ සේවා වියුක්ත ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය ශ්‍රම බලකායට අයත් වේ. ශ්‍රම බලකායේ පහළ යෑම විශේෂයෙන්ම ග්‍රාමීය ක්ෂේත්‍රයේ කාන්තාවන් අතර කැපී පෙනෙන ලෙස දක්නට ලැබුණි. මේ අතර වැඩ කරන වයසේ කුටුම්භ ජනගහනයේ කොටසක් වන ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය, 2017 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2018 පළමු භාගය තුළ දී සියයට 9.0 කින් ඉහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වගා කන්න කිහිපයක් පුරාවට පැවති අහිතකර කාලගුණික තත්ත්වය වන අතර පළමුව කෘෂිකාර්මික අංශයට බලපෑ මෙම අහිතකර තත්ත්වය පසුකාලීනව කාර්මික හා සේවා අංශ දක්වා ද ව්‍යාප්ත විය. තවද, 2017 සහ 2018 වසරවල් තුළ දී, නියමු ව්‍යාපෘතියක් ලෙස, "13 වසරක සහතික කළ අධ්‍යාපනය" වැඩසටහන ක්‍රියාත්මක වීමත් සමග අධ්‍යාපන කටයුතුවල නිරත වන ප්‍රමාණය ඉහළ යෑම, තරුණයින් අතර දක්නට ලැබුණු ආර්ථික අක්‍රීය භාවයට හේතුවක් වූ බවට සැලකිය හැකිය.

- **ශ්‍රම බලකාය සහ වැඩ කරන වයසේ ජනගහනය අතර අනුපාතය හෙවත් ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ සියයට 54.3 සිට 2018 පළමු කාලපරිච්ඡේදය තුළ දී සියයට 51.5 දක්වා පහළ ගිය අතර මේ සඳහා ශ්‍රම බලකායේ අඩුවීම සහ වැඩකරන වයසේ ජනගහනයේ වැඩිවීම හේතු විය.** එමෙන්ම ස්ත්‍රී සහ පුරුෂ යන පාර්ශ්ව දෙකෙහිම ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකයන්ගේ පහළ යෑම ද මෙම ප්‍රවණතාව සඳහා හේතු විය. 2018 පළමු භාගය තුළ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 73.0 ක් ද ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 33.0 ක් ලෙස ද වාර්තා විය. ආර්ථිකය තුළ ස්ත්‍රීන්ගේ සක්‍රීය දායකත්වය, තවදුරටත් විභව මට්ටමට වඩා පහළ අගයක පවතින හෙයින් ස්ත්‍රී ශ්‍රම බලකාය ඉහළ නැංවීම ආර්ථිකය තුළ පවතින තියුණු ශ්‍රම හිඟය සඳහා තිරසාර විසඳුමක් ලෙස සැලකිය හැකිය. මෙමගින් ජනතාවගේ ජීවන මට්ටම වඩා වර්ධනය වන පරිදි කුටුම්භ ආදායම ඉහළ නැංවීමට හා අපේක්ෂිත ආර්ථික වර්ධන වේගය ළඟා කර ගැනීමට පහසුකම් සැලසේ.

## සේවා නියුක්තිය

- **ආර්ථිකය තුළ සපුරාලන ලද ශ්‍රම ඉල්ලුම පෙන්නුම් කරන සේවා නියුක්තිය, 2017 පළමු භාගයට සාපේක්ෂව 2018 පළමු භාගයේ දී මිලියන 8.184 සිට මිලියන 7.966 දක්වා සියයට 2.7 කින් පහළ ගියේය.** අංශ අනුව සේවා නියුක්තිය සැලකීමේ දී මුළු සේවා නියුක්තියෙන් සියයට 46.8 කට දායක වන සේවා අංශය, රැකී රක්ෂා වැඩි වශයෙන්ම උත්පාදනය කරන අංශය විය. 2018 වසරේ පළමු භාගය තුළ දී කෘෂිකාර්මික සහ කාර්මික අංශ මුළු සේවා නියුක්තියේ පිළිවෙළින් සියයට 25.5 සහ සියයට

27.7 කට ආයක විය. රැකියාවල නියුක්ත සංඛ්‍යාවේ නිරීක්ෂිත පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ මෑත කාලීනව ඇති වූ අහිතකර කාලගුණ විපර්යාස වේ. කෘෂිකාර්මික අංශය එම තත්ත්වවල බලපෑමට සෘජුවම ලක්වීමේ ප්‍රතිඵලයක් ලෙස එම අංශයේ සේවා නියුක්තිය 2017 පළමු භාගයට සාපේක්ෂව 2018 පළමු භාගයේ දී සියයට 6.2 කින් පහළ ගියේය. කාලගුණ විපර්යාසවල අහිතකර බලපෑම අනෙකුත් අංශ, විශේෂයෙන් කෘෂිකාර්මික යෙදවුම් මත යැපෙන හෝ කෘෂිකර්මාන්තය සමග සෘජුවම සම්බන්ධ ආර්ථික ක්‍රියාකාරකම් වෙත ද ව්‍යාප්ත විය.

- **සේවා නියුක්ති ස්වභාවය සැලකීමේදී, 2018 වසරේ පළමු භාගය තුළ දී රාජ්‍ය අංශය හැර අනෙකුත් සියලු අංශවල සේවා නියුක්තිය පහළ ගියේය.** පෙර වසරේ පළමු භාගය හා සැසඳීමේදී 2018 වසරේ පළමු භාගය තුළ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 9,590 කින් ඉහළ ගියේය. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2018 වසරේ පළමු භාගය අවසානයේ රාජ්‍ය අංශයේ මුළු සේවක සංඛ්‍යාව 1,370,885 ක් විය. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ වියදම් ඒකක සහ රාජ්‍ය ව්‍යවසාය ආයතන, රාජ්‍ය අංශයේ ආයතන ලෙස සැලකේ.

4

### සේවා වියුක්තිය

- **2018 වසරේ පළමු භාගයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සේවා වියුක්ති අනුපාතිකය සියයට 4.3 සිට සියයට 4.5 දක්වා ඉහළ ගියේය.** මුළු සේවා වියුක්ත ජනගහනය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ 366,734 ට සාපේක්ෂව, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී 376,984 ක් ලෙස ඇස්තමේන්තුගත කෙරිණි. පුරුෂ සේවා වියුක්තිය සියයට 2.9 සිට සියයට 3.0 දක්වා සුළු වශයෙන් ද ස්ත්‍රී සේවා වියුක්තිය සියයට 6.8 සිට සියයට 7.4 දක්වා ද ඉහළ ගියේය. මෙමගින් නිරූපණය වන්නේ සමස්ත සේවා නියුක්තියේ පහළ යෑම පුරුෂ ශ්‍රම බලකායට වඩා ස්ත්‍රී ශ්‍රම බලකායට වැඩි වශයෙන් සංවේදනය වන බවයි. මෙම ප්‍රවණතා මගින් දිගින් දිගටම අවධාරණය කර සිටිනුයේ ශ්‍රම වෙළඳපොළ තුළ ස්ත්‍රී - පුරුෂ භාවය පදනම් කරගත් විෂමතාව ප්‍රමුඛව පවතින බවත්, ආර්ථිකය තුළ සිදුවන වෙනස්කම්වලට ස්ත්‍රී ශ්‍රම බලකාය වඩා වැඩි වශයෙන් අනාවරණය වන බව හා සංවේදී වන බවත් ය.

- **වයස අවුරුදු 40ට අඩු සියලු වයස් කාණ්ඩ සැලකූ විට සේවා වියුක්ති අනුපාතිකය 2018 වසරේ පළමු භාගය තුළ ඉහළ ගොස් ඇත.** තරුණයන්ගේ[3] සේවා වියුක්තිය අඛණ්ඩව සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවති අතර 2018 වසරේ පළමු භාගය තුළ දී එය සියයට 22.1 ක් විය. අනෙක් අතට, අවුරුදු 30-39 සහ අවුරුදු 40 හා ඊට ඉහළ වයස් කාණ්ඩ පිළිවෙළින් සියයට 3.3 හා සියයට 0.7 ක් ලෙස සාපේක්ෂව පහළ සේවා වියුක්ති අනුපාතික වාර්තා කළේය. 2018 වසරේ පළමු භාගය තුළ, අවුරුදු 40 හා ඊට ඉහළ වයස් කාණ්ඩයේ සේවා වියුක්තිය ඊට පෙර වසරේ අනුරූප කාලය තුළ වාර්තා කළ අගයට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙයට ප්‍රධාන හේතු ලෙස මෙම වයස් කාණ්ඩවල රැකියා අපේක්ෂකයන්ගේ ඉහළ නිපුණතා හා පළපුරුද්ද හේතු විය. තරුණයන් අතර දක්නට ලැබෙන සාපේක්ෂව ඉහළ සේවා වියුක්තිය තුළින් වඩාත් ඵලදායී මානව සම්පත ප්‍රමාණවත් ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැති බව පෙන්නුම් කරයි. අනෙක් අතට, මෙමගින් ඉහළ වයස් කාණ්ඩවල පුද්ගලයන් මත ආර්ථික වශයෙන් අතිරේක බරක් පැටවෙන අතර, මෙම පුද්ගලයන් හට විශ්‍රාම යන වයසෙන් පසුව ද අඛණ්ඩව රැකියාවල නිරතවීමේ අවශ්‍යතාවයක් ඇතිවේ. බොහෝ විට ඔවුන්ට ඌන සේවා නියුක්ති තත්ත්වයන්ට මුහුණ පෑමට ද සිදුවනු ඇත. මෙමගින් වයස්ගත පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය පහළ වැටීමක් සිදුවිය හැකි අතර එමගින් බරපතල සාමාජයීය ගැටලු නිර්මාණය වීම ද සිදුවිය හැකිය.

- **අධ්‍යාපන මට්ටම අනුව සලකා බැලීමේදී, ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ලද කාණ්ඩයෙන් ඉහළම සේවා වියුක්ති අනුපාතිකය වාර්තා විය.** මේ අනුව, අ.පො.ස. (උසස් පෙළ) සහ ඊට ඉහළ අධ්‍යාපනික සුදුසුකම් ලද කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය පසුගිය වසරේ පළමු භාගය තුළ වාර්තා වූ සියයට 8.0 ට සාපේක්ෂව 2018 වසරේ පළමු භාගය තුළ දී සියයට 9.2 ක් ලෙස වාර්තා විය. ඉහළ අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයන්ගේ සේවා වියුක්ති අනුපාතිකය ඉහළ අගයක් ගැනීමට ප්‍රධාන හේතුව ලෙස ශ්‍රම වෙළඳපොළ තුළ පවතින කුසලතාවල නොගැළපීම් හැඳින්විය හැකිය. අධ්‍යාපන සුදුසුකම් සහිත තරුණ කාණ්ඩය තුළ පවත්නා ඉහළ සේවා

3 වයස අවුරුදු 15-24 අතර


වියුක්තිය, ඌන සේවා නියුක්තියට මගපාදන අතර එමගින් අඩු වැටුප්/වරප්‍රසාද හා රැකියා අනාරක්ෂිතභාවය වැනි තත්ත්ව ඇති විය හැකිය.

## විදේශ සේවා නියුක්තිය

- **විදේශ රැකියා සඳහා පිටත්ව යන කාන්තාවන් සංඛ්‍යාව ඉහළ ගිය ද 2018 පළමු භාගයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සමස්තයක් ලෙස සියයට 2.4 කින් පහළ ගියේය.** නුපුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම අවම කිරීමට රජයෙන් ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්වල මෑත කාලීනව දක්නට ලැබුණු සමස්ත පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය හැකිය. තවද, මෙම පහළ යෑම සඳහා මැද පෙරදිග රටවල් වැනි සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ ප්‍රධාන ගමනාන්තවල සංක්‍රමණික ශ්‍රමය සීමා කිරීම සඳහා ගනු ලැබූ ජාතික ප්‍රතිපත්ති සහ දේශීය ආර්ථිකය තුළ නැගී එන අංශවල ඇති ශ්‍රම හිඟය හේතුවෙන් දේශීය ශ්‍රම වෙළඳපොළ තුළින් පැන නැගී ඇති ඉහළ ගිය ශ්‍රම ඉල්ලුම දායක විය. 2018 පළමු භාගයේ දී පුරුෂ හා කාන්තා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සමස්ත විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් වලින් පිළිවෙළින් සියයට 62.0 ක් සහ සියයට 38.0 ක් ලෙස වාර්තා විය. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සාපේක්ෂව බලන කල, 2018 වසරේ පළමු භාගයේ දී පුරුෂ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සියයට 8.3 කින් පහළ ගිය අතර, කාන්තා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සියයට 8.8 කින් ඉහළ ගියේය. කාන්තා විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් සංඛ්‍යාව 2017 පළමු කාර්තුවේ සිට පෙන්නුම් කළ ඉහළ යෑමේ නැඹුරුව අඛණ්ඩව පැවතුණි.

**4.6 රූප සටහන**

**කුසලතා මට්ටම අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් (වසරේ පළමු භාගය තුළ)**




(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

- **2018 පළමු භාගයේ දී විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ගෙන් සියයට 55 ක් නුපුහුණු ශ්‍රමිකයන් සහ ගෘහ සේවිකාවන් විසින් නියෝජනය කළේය.** පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2018 වසරේ පළමු භාගයේ දී වෘත්තීය, මධ්‍යම මට්ටමේ, ලිපිකරු හා ඒ ආශ්‍රිත සහ ගෘහ සේවිකා කාණ්ඩ යටතේ රැකියා සඳහා පිටත්ව යෑම් ඉහළ ගිය ද, පුහුණු ශ්‍රමික, අර්ධ පුහුණු ශ්‍රමික සහ නුපුහුණු ශ්‍රමික කාණ්ඩ යටතේ රැකියා සඳහා පිටත්ව යෑම් පහළ යෑමක් පෙන්නුම් කළේය. 2018 පළමු භාගය තුළ දී, කාන්තා සංක්‍රමණික ශ්‍රමිකයන්ගෙන් සියයට 79 ක් වැනි සැලකිය යුතු ප්‍රතිශතයක් ගෘහ සේවිකා රැකියා සඳහා පිටත්ව ගොස් ඇත. පෙර වසරේ පළමු භාගය හා සැසඳීමේදී 2018 පළමු භාගයේ දී, ගෘහ සේවිකා කාණ්ඩය යටතේ පිටත්ව යෑම් 31,062 දක්වා සියයට 11 කින් ඉහළ ගියේය. මෙමගින් ආරක්ෂිත සහ පුහුණු සංක්‍රමණයක් සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කළ ප්‍රතිපත්තිවල දිගු කාලීන ඵලදායිතාව ඇගයීමේ අවශ්‍යතාව ද පිළිබිඹු වේ. විදෙස්ගත සේවකයන්ගේ ප්‍රේෂණ මත ආර්ථිකය සැලකිය යුතු ලෙස රඳා පවතින බැවින් අනාගතයේදී විදේශ ප්‍රේෂණ රට තුළට ගලා ඒමෙහි තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා වඩා ඉහළ නිපුණතා කාණ්ඩ යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් දිරිමත් කිරීම සඳහා වන ප්‍රතිපත්ති තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. 2018 වසරේ පළමු භාගයේ දී වෘත්තීය හා මධ්‍යම මට්ටම යන කාණ්ඩ, සමස්ත පිටත්ව යෑම් සංඛ්‍යාවෙන් සියයට 7 කට පමණ දායක විය.

## කම්කරු සබඳතා

- **රට තුළ ආර්ථික හා සාමාජයීය කටයුතුවලට ඇඩි බාධා ඇති කරමින් රාජ්‍ය අංශය තුළ වැඩ වර්ජන ගණනාවක් ක්‍රියාත්මක විය.** මාධ්‍ය වාර්තාවලට අනුව, සාමාන්‍ය ජන ජීවිතයට, ආර්ථික හා සාමාජයීය ක්‍රියාකාරකම්වලට සැලකිය යුතු ලෙස බාධා ඇති කරමින් 2018 මුල් මාස 8 තුළ දී රාජ්‍ය අංශයේ සෞඛ්‍යය, අධ්‍යාපන, තැපැල් සහ ප්‍රවාහන අංශවල වැඩ වර්ජන 7 ක් ක්‍රියාත්මක වී තිබේ. කෙසේ වෙතත් කම්කරු දෙපාර්තමේන්තුවේ දත්ත අනුව, පෞද්ගලික අංශය තුළ, වැඩ වර්ජන සංඛ්‍යාව, ඒ සඳහා සම්බන්ධ වූ සේවක සංඛ්‍යාව සහ වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණන අඩුවීමක් වාර්තා කර තිබේ. 2017 වසරේ පළමු භාගයේ දී 33,353 ක් ලෙස වාර්තා වූ පෞද්ගලික අංශයේ වැඩ

4

වර්ජන නිසා අහිමි වූ මිනිස් දින ගණන 2018 පළමු භාගයේ දී 18,840 දක්වා සියයට 43 කින් පහළ ගියේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වුයේ වැවිලි කර්මාන්ත නොවන අනෙකුත් අංශ තුළ දක්නට ලැබුණු වැඩ වර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් දින ගණනේ පහළ යෑමයි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වැඩ වර්ජනවලට සහභාගී වූ 6,855 ක් වූ සේවක සංඛ්‍යාව, 2018 පළමු භාගය තුළ දී 3,573 ක් දක්වා පහළ ගියේය. කෙසේ වෙතත්, අදාළ කාලය තුළ දී වැවිලි කර්මාන්ත අංශයේ කම්කරු සබඳතාවල යම් පිරිහීමක් දක්නට ලැබුණි. මෙම කාලපරිච්ඡේදය තුළ එම අංශයේ සේවකයන් 1,177 ක් සම්බන්ධ වෙමින් ක්‍රියාත්මක වූ වැඩ වර්ජන 9 ක් හේතුවෙන් මිනිස් දින 8,879 ක් අහිමි විය. එසේ අහිමි වූ මිනිස් දින ගණන 2017 පළමු භාගය හා සැසඳීමේදී 2.5 ගුණයක වැඩිවීමකි.

4

- **රට තුළ ක්‍රියාත්මක වන දැඩි සහ නම්‍යශීලී බවින් අඩු කම්කරු නීති හේතුවෙන් පැන නැගී ඇති ශ්‍රම වෙළඳපොළේ දීර්ඝ කාලීන ගැටලුවලට විසඳුම් ලබා දීම සඳහා කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය විසින් ක්‍රියාමාර්ග ගණනාවක්ම 2018 පළමු භාගය තුළ දී ගෙන තිබුණි.** පෞද්ගලික අංශයේ රැකියා සම්බන්ධ නියමයන් සහ කොන්දේසිවලට අදාළ කම්කරු නීතිවල පවතින අක්‍රමිකතා සහ විෂමතාවලට විසඳුමක් වශයෙන්, 'තේවල කම්කරු නීතියක් (Single Employment Law)' හඳුන්වා දීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇත. අසමානතා වලින් තොර පූර්ණ සහ ඵලදායී සේවා නියුක්තියක් සහතික කිරීම, වැඩබිම තුළ ලිංගික හිංසනය වැළැක්වීම සහ නම්‍යශීලී සේවා කාලයන් සඳහා කටයුතු සැලසීම සඳහා අදාළ විධි විධාන, යෝජිත කම්කරු නීතිවලට ඇතුළත් කිරීමට නියමිතව පවතී. දරු උපත් වලින් පසුව කාන්තාවන් නැවත ශ්‍රම බලකායට එකතු වීම ධෛර්යමත් කරනු පිණිස පුද්ගලික අංශයේ සේවයේ නියුතු කාන්තාවන්ට, දරු උපත් සංඛ්‍යාව පිළිබඳ සීමාවක් නොමැතිව මාතෘ ප්‍රතිලාභ ප්‍රදානය කිරීම සඳහා 1939 අංක 32 දරණ මාතෘ ප්‍රතිලාභ පිළිබඳ ආඥා පනතට සහ 1954 අංක 19 දරණ කඩසාප්පු සහ කාර්යාල පනතට සංශෝධන ඉදිරිපත් කර තිබේ. අන්තර්ජාතික වෙළඳපොළ ඉලක්ක කොට, සදාචාර සම්පන්න ලෙස (Ethical) භාණ්ඩ නිෂ්පාදනය හා අපනයනය සිදුකරන රටක් ලෙස ශ්‍රී ලංකාව ස්ථාපිත කිරීම අරමුණු කරගෙන, බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම වැළැක්වීම සඳහා 'අනතුරුදායක රැකියා ලැයිස්තුව' සංශෝධනය කිරීමට පියවර ගැනුණි. තවද ඵලදායිතාව වර්ධනය වන අයුරින්, සාකච්ඡා මගින් වැඩ බිම් තුළ මතුවන අර්බුද අවම කිරීම හරහා කාර්මික සාමය වඩා වර්ධනය කිරීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් 'සමාජ කතිකාවත' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

## ශ්‍රම ඵලදායිතාව

- **වැඩ කරන ලද පැයකට එකතු කළ අගය වශයෙන් (2010 මිල මත පදනම්ව) මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2017 වසරේ පළමු කාර්තුවේ වාර්තා වූ රුපියල් 445.28 ට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තුවේ දී රුපියල් 472.14 දක්වා සියයට 6.0 කින් ඉහළ ගියේය.** 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සාපේක්ෂව බලන කළ අංශ තුනෙහිම ශ්‍රම ඵලදායිතාවෙහි ධනාත්මක වර්ධනයක් වාර්තා විය. වැඩ කළ පැයකට රුපියල් 566.05 ක් වන ඉහළතම ඵලදායිතාවය වාර්තා කළ සේවා අංශය තුළින්, ශ්‍රම සම්පතෙහි වඩාත් ඉහළම කාර්යක්ෂම භාවිතාව පිළිබිඹු වූ අතර කර්මාන්ත අංශය ඊට සමීප අගයක් වන වැඩ කළ පැයකට රුපියල් 556.29 ක ඵලදායිතා මට්ටමක් වාර්තා කළේය. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සාපේක්ෂව බලන කළ, 2018 වසරේ පළමු කාර්තුවේ සමස්ත ශ්‍රම ඵලදායිතාවේ වූ වැඩි දියුණුව සඳහා දළ එකතු කළ අගයෙහි වූ වර්ධනය සහ වැඩ කළ පැය ගණනෙහි වූ පහළ යෑම දායක විය. මෑත කාලයේ දක්නට ලැබුනු ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, කෘෂිකාර්මික අංශය 2018 පළමු කාර්තුවේ දී වැඩ කළ පැයකට රුපියල් 155.48 ක් වූ අවම ඵලදායිතාව වාර්තා කළේය.

## අපේක්ෂිත වර්ධන

### මිල

- **උද්ධමනය, 2018 වසරේ ඉදිරි කාලපරිච්ඡේදය තුළ මැද තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.** මනාව පාලනය කෙරුණු උද්ධමන අපේක්ෂා, ඉදිරි දැක්ම මත පදනම් වූ මුදල් කළමනාකරණය සහ සතුටුදායක දේශීය සැපයුම් තත්ත්ව, පොදු මිල මට්ටම අඩු මට්ටමක පැවතීමට දායක වේ යැයි අපේක්ෂා කළ හැකිය. කෙසේ වුවද, මෙවැනි හිතකර ප්‍රවණතාවලට විරුද්ධ සාධක කිහිපයක් මගින් මිල

ගණන් ඉහළ යෑම සඳහා යම් ප්‍රමාණයක පීඩනයක් එල්ල විය හැකිය. ආහාර නොවන කාණ්ඩයේ අයිතම වන ඉන්ධන, ගෑස් සහ විදුලි ගාස්තුවල පරිපාලිත මිල ගණන් ඉහළ දැමීමට ඇති හැකියාව සහ ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් දේශීය මුදල් දුර්වල වීම සහ පාරිභෝගික භාණ්ඩවල ජාත්‍යන්තර මිල ගණන් අඩුවීමේ ප්‍රවණතාව ප්‍රතිවර්තනය වීමේ හැකියාව හේතුවෙන් ආනයනික භාණ්ඩවල මිල විචලන මගින් ඇතිකරනු ලබන උද්ධමන පීඩනය එවැනි සාධක වේ.

- **එළවළු වැනි නිතර මිල උච්චාවචනය සිදුවන ආහාර අයිතමවල ඇතැම් කාලපරිච්ඡේද තුළ දී ඇති වූ අධික සැපයුම් හේතුවෙන් වෙළෙඳපොළ තුළ ඉතා අඩු මිල ගණන් පැවති අතර එමගින් ගොවීන්ගේ ආදායම පහළ ගියේය.** මෙම ගැටලුව විසඳීමට රටෙහි එකම කාලපරිච්ඡේදය තුළ දී සමාන වර්ගයේ භෝග විශාල ලෙස වගා කිරීම සීමා කිරීම සඳහා අවධානය යොමු විය යුතුය. ඒ සඳහා, ගොවීන්ට අවශ්‍ය නිෂ්පාදනය පිළිබඳ උපදෙස් ලබාදීම/මඟපෙන්වීම සහ අලෙවිකරණ තොරතුරු ලබාදීමට උපායමාර්ගයක් වැඩිදියුණු කිරීමට ඇති හැකියාව පිළිබඳව රජය සොයා බැලිය යුතුය. එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ස්ථාපිත කරන ලද උපකාරක සේවාවක් මගින් ගොවීන්ට අදාළ සහ කාලීන තොරතුරු ලබාදීමට, පවතින තොරතුරු සහ විශාල දත්ත විශ්ලේෂණ භාවිතා කරන තොරතුරු බෙදාහැරීමේ ක්‍රමවේදයක් (Big Data Analytics) ස්ථාපනය කිරීම සිදු කළ හැකිය. තවද, වෙළඳපොළ බාධා සහ වෙළඳපොළ අතර මිල අසමානතා අවම කිරීමට පිටකොටුව සහ දඹුල්ල වැනි ආර්ථික මධ්‍යස්ථානවල සාධාරණ වෙළඳ ප්‍රතිපත්ති පරිචයන් ප්‍රවර්ධනය කිරීම සිදු කළ යුතුය.

## ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

- **ශ්‍රම වෙළඳපොළෙහි අවශ්‍යතාවන්ට ගැලපෙන රැකියා අපේක්ෂකයන් බිහි කිරීමට නිසි පිළිගැනීමක් සහ ගුණාත්මක තත්ත්ව සහිත පෞද්ගලික අධ්‍යාපන ආයතනවලට ඉඩ ලබාදිය යුතුය.** ජාතික මට්ටමෙන් විශ්ව විද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේදී ඉදිරි කාලයේ දී ශ්‍රම ඉල්ලුමක් ඇතිකරන අංශ පිළිබඳව මනා අවධානයක් යොමු කිරීම වැදගත් වේ. ජනගහනය වයස්ගත වීමේ සංසිද්ධියක් පවතින අතරතුර රැකියා අවස්ථා සීමිත අංශ ඉලක්ක කර උපාධිධාරීන් බිහි කිරීම තවදුරටත් සමාජ ආර්ථික ගැටලු ඇති වීමට හේතුවිය හැකිය. කෙසේ වුව ද, ආර්ථිකයේ ඇතැම් අංශවලින් පෞද්ගලික විශ්ව විද්‍යාල අධ්‍යාපනය ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඇති විය හැකි අතර නොමිලේ අධ්‍යාපනය ලබාදෙන ජාතික විශ්ව විද්‍යාල පද්ධතියට ඇතුළත් විය නොහැකි ශිෂ්‍යයන්ට තෘතීයික අධ්‍යාපන ප්‍රවේශය ලබා දීම සඳහා මෙම විරෝධතා කළමනාකරණය කරගත යුතුය. මනා පුහුණුවක් සහිත ශ්‍රම බලකායක් ගොඩනැගීමට ද මෙය දායක විය හැකිය.

- **උපයෝගී නොවූ ග්‍රාමීය ශ්‍රම සම්පත ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රම හිඟය පිළිබඳ ගැටලුව විසඳීම සඳහා වෘත්තීය පුහුණු ආයතන ප්‍රතිසංවිධාන කිරීම වැදගත් වේ.** සැපයුම පදනම් කරගත් පුහුණු ආකෘති බිඳ දමමින් ඉල්ලුම පදනම් කරගත් පුහුණු ආකෘති ප්‍රවර්ධනය කිරීම සිදුකළ යුතු අතර ඒ වෙනුවෙන් පාඨමාලා නවීකරණය සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා වෘත්තීය පුහුණු ආයතන පෞද්ගලික අංශය සමඟ අත්වැල් බැඳගත යුතුය. පෞද්ගලික අංශය සමඟ ඵලදායීව සම්බන්ධ වීම සීමා කිරීමට හේතු වන දැඩි විධිවිධාන නම්‍යශීලි කළ යුතු අතර එකම කාණ්ඩයේ පුහුණු ආයතන අතර සමායෝජනය ද ඉතා වැදගත් වේ. අනෙක් අතට, මුළු ජනගහනයෙන් සියයට 80 ක් පමණ වන ග්‍රාමීය ජනගහනය, ශ්‍රම සම්පත උපයෝජනයෙහි ලා විශාල වශයෙන් පාදක වේ. ඵලදායී සන්නිවේදන ක්‍රමෝපායන්, රැකියා අවස්ථා පිළිබඳ ගෙයින් ගෙට දැනුවත් කිරීමේ වැඩසටහන් සහ රැකියාවේ නියුතුව පුහුණු වීමේ අවස්ථා මගින් වෘත්තීය පුහුණු ආයතන ග්‍රාමීය ප්‍රජාවට සමීප කිරීම තුළින් ඔවුන්ගේ, විශේෂයෙන්ම තරුණ තරුණියන්ගේ, කුසලතා වැඩිදියුණු කිරීමට අවස්ථාව සැලසේ. එවැනි ක්‍රමෝපායයන් දේශීය ශ්‍රම අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා වන මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම සඳහා දායක කර ගත හැකි අතර රජයේ ප්‍රාදේශීය සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ද මධ්‍යකාලීනව සහ දිගුකාලීනව ප්‍රයෝජනවත් විය හැකිය.

- **පවතින දැඩි කම්කරු නීති මගින් අනාරක්ෂිත අර්ධ කාලීන රැකියා සහ අනියම් රැකියා දිරි ගැන්වීමක් සිදුකරන අතරම සේවා නියුක්ත ජනගහනයෙන් වැඩි කොටසක් අවිධිමත් සේවා නියුක්තියක් වෙත ආකර්ෂණය කර ගනු ඇත.** පැය විසි හතර පුරාම ක්‍රියාත්මක වන කර්මාන්ත බිහිවීමත් සමඟ නූතන

ආර්ථිකයෙහි පවතින රැකියා අවස්ථා ග්‍රහණය කරගැනීම සඳහා ප්‍රශස්ත ශ්‍රම වෙළඳපොළකට පහසුකම් සැපයීමේ අරමුණින් යල් පැන ගිය නීතිමය සීමාවන් ඉවත් කිරීම වැදගත් වේ. ඒ අනුව, නිරන්තරයෙන් බලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන පරිදි වැඩකරන පැය ගණන නම්‍යශීලී කිරීම, අර්ධ කාලීන රැකියා සහ සතියේ වැඩකරන මුළු පැය ගණන වැඩ කරන දින පහ තුළ යොදා ගැනීම වැනි වැඩ පිළිවෙළවල්, විවිධ ප්‍රදේශ සහ විවිධ කර්මාන්ත පුරා ක්‍රියාත්මක කිරීමේ හැකියාව සොයා බැලීම අවශ්‍ය වේ. කාන්තා කුටුම්භ ජනගහනයෙන් සියයට 65 කට වැඩි වර්තමානයේ ආර්ථිකමය වශයෙන් අක්‍රීය කාන්තාවන්ගේ ශ්‍රමය පූර්ණ උපයෝජනය සඳහා ද මෙය දායක විය හැකිය. මෙවැනි ප්‍රතිසංස්කරණ සිදු කිරීමේදී කම්කරු උපදේශන සභා තුළ තරුණ නියෝජනයක් ඇති කිරීමේ වැදගත්කම වන්නේ අනාගත ශ්‍රම වෙළඳපොළ සහශ්‍රිකයන්ගේ (Millennials) සහ පසුකාලීන පරම්පරාවල නිතර වෙනස්වන සුළු අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සකස් විය යුතු හෙයිනි.

- **ව්‍යාපාර මගින් සිදුකරන ශ්‍රමය ඉතිරි කිරීම ඉලක්ක කරගත් ආයෝජන ආර්ථිකයෙහි පවතින උග්‍ර ශ්‍රම හිඟයට විසඳුමක් විය හැකිය.** කෘතිම බුද්ධිය (Artificial Intelligence), රොබෝ තාක්ෂණය මගින් ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය (Robotic Process Automation), යාන්ත්‍රික ඉගෙනුම් (Machine Learning) වැනි නව්‍ය ක්‍රියාමාර්ග මගින් දැනට පවතින ව්‍යාපාර මෙහෙයුම් ස්වයංක්‍රීයකරණය කිරීමෙන් ශ්‍රමය ඉතිරි කරගත හැකි අතර අගය දාමය තුළ ඵලදායිතාව ඉහළ නැංවීමට ද හැකියාව ඇත. ස්වභාවයෙන්ම පුනරාවර්තනය නොවන ක්‍රියාකාරකම් සහ වැඩි නිර්මාණශීලීත්වයක් අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා හිඟ මානව ප්‍රාග්ධනය ශේෂ කර තබා ගැනීමට ද මෙය උපකාරී වේ. එවැනි ඵලදායිතා වර්ධන ක්‍රියාමාර්ග ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහත සඳහන් ක්‍රමෝපායයන් සංවර්ධනය සහ භාවිතා කරන දේශීය ව්‍යවසායකයන් ඉලක්ක කර සහනශීලී ණය පහසුකම් හඳුන්වාදීම සහ එම ක්ෂේත්‍රවලට අදාළ විදේශීය ආයෝජන වෙනුවෙන් බදු සහන ලබා දීම මගින් රජයට මේ සඳහා මැදිහත් විය හැකිය.

- **විදේශ සේවා නියුක්තිය පහළ යෑම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පහළ යෑමට හේතු විය හැකි අතර එය බාහිර ජංගම ගිණුමට අහිතකර ලෙස බල පෑ හැකි වුවද පුහුණු ශ්‍රමික කාණ්ඩයේ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් ප්‍රවර්ධනය කිරීම මගින් එම බලපෑම සමනය කරගැනීමට කටයුතු කළ යුතුය.** පෞද්ගලික අංශයේ කාර්මික විශේෂඥතාව යොදා ගනිමින් අධ්‍යාපන පද්ධතියේ සහ වෘත්තීය පුහුණු ආයතනවල පෙර සඳහන් කළ පරිදි ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිසංවිධාන ක්‍රියාත්මක කිරීම ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ තුළ සේවයේ නියුතු වීමට සුදුසුකම් සහ සූදානම සහිත පුහුණු ශ්‍රම බලකායක් ගොඩනැංවීමට උපකාරී විය හැකිය. සෘජු ප්‍රතිලාභයක් වශයෙන් මෙමගින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යන අතර වක්‍රකාරව ඔවුන්ගේ පවුල්වල ජීවන මට්ටම ඉහළ යනු ඇත. ඒ අනුව, නුපුහුණු ශ්‍රමික කාණ්ඩයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් අධෛර්යමත් කරන අතරතුර පුහුණු ශ්‍රමික කාණ්ඩයෙන් විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් ප්‍රවර්ධනය කිරීම තවදුරටත් ශක්තිමත් කළ යුතුය.